# දසමො පාඨො

සෙතව්‍යවාසිනො හි චූලකාලො මජ්ඣිමකාලො මහාකාලොති තයො භාතරො කුටුම්බිකා. තෙසු ජෙට්ඨකනිට්ඨා දිසාසු විචරිත්වා සකටෙහි භණ්ඩං ආහරන්ති. මජ්ඣිමකාලො ආහතං වික්කිණාති. අථෙකස්මිං සමයෙ තෙ උභොපි භාතරො පඤ්චහි සකටසතෙහි නානා භණ්ඩං ගහෙත්වා සාවත්ථිං ගන්ත්වා සාවත්ථියා ච ජෙතවනස්ස ච අන්තරෙ සකටානි මොචයිංසු. තෙසු මහාකාලො සායණ්හසමයං මාලාගන්ධාදිහත්ථෙ සාවත්ථිවාසිනො අරියසාවකෙ ධම්මසවණත්ථාය ගච්ඡන්තෙ දිස්වා "කුහිං ඉමෙ ගච්ඡන්තී"ති පුච්ඡිත්වා තමත්ථං සුත්වා 'අහම්පි ගමිස්සාමී'ති චින්තෙත්වා කනිට්ඨං ආමන්තෙත්වා, "තාත සකටෙසු අප්පමත්තො හොහි. අහං ධම්මං සොතුං ගච්ඡාමී"ති වත්වා තථාගතං වන්දිත්වා පරිසපරියන්තෙ නිසීදි. සත්ථා තං දිස්වා අජ්ඣාසයවසෙන ආනුපුබ්බීකථං කථෙන්තො දුක්ඛක්ඛන්ධසුත්තාදිවසෙන අනෙකපරියායෙන කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං ච කථෙසි. තං සුත්වා මහාකාලො සබ්බං කිර පහාය ගන්තබ්බං, පරලොකං ගච්ඡන්තං නෙව භොගා න ඤාතයො අනුගච්ඡන්ති. කිංමෙ ඝරාවාසෙන, පබ්බජිස්සාමීති චින්තෙසි.

(චූලකාලමහාකාලවත්ථු - ධම්මපදට්ඨකථා)

පදමාලාව

| | | | |
|---|---|---|---|
| **සෙතව්‍යවාසිනො** | (ස) | - | සේතව්‍ය නුවර වැසි |
| **තයො** | (ස.නා) | - | තිදෙනෙක් |
| **භාතරො** | (නා) | - | සහෝදරයෝ |
| **කුටුම්බිකා** | (ත) | - | කෙළඹියෝ |
| **තෙසු** | (ස.නා) | - | ඔවුන් අතරින් |
| **ජෙට්ඨකනිට්ඨා** | (ස) | - | වැඩිමහල්ලා හා බාලයා |
| **දිසාසු** | (නා) | - | දිශාවන්හි |
| **විචරිත්වා** | (පූ.ක්‍රි) | - | හැසිර |
| **සකටෙහි** | (නා) | - | කරත්තවලින් |
| **භණ්ඩං** | (නා) | - | බඩු |
| **ආහරන්ති** | (ක්‍රි) | - | ගෙනෙති |
| **ආහතං** | (කි) | - | රැගෙන ආ දේ |
| **වික්කිණාති** | (ක්‍රි) | - | විකුණයි |
| **අථ** | (නි) | - | ඉක්බිති |
| **උභොපි** | (සං) | - | දෙදෙනා ම |
| **පඤ්චහි සකටසතෙහි** | (ස) | - | ගැල් පන්සියයකින් |
| **නානාභණ්ඩං** | (ස) | - | නොයෙක් බඩු |
| **ගහෙත්වා** | (පූ.ක්‍රි) | - | ගෙන |

| | | | |
|---|---|---|---|
| **ගන්ත්වා** | **(පූ.ක්‍රි)** | - | ගොස් |
| **අන්තරෙ** | **(නි)** | - | අතර |
| **මොචයිංසු** | **(ක්‍රි)** | - | මුදා හළහ |
| **සායණ්හසමයෙ** | **(ස)** | - | සවස් කල |
| **මාලාගන්ධාදිහත්ථෙ** | **(ස)** | - | මල්මාලා සුවඳ ආදිය ගත් අත් ඇති |
| **අරියසාවකෙ** | **(ස)** | - | ආර්ය ශ්‍රාවකයන් |
| **ධම්මසවණත්ථාය** | **(ස)** | - | බණ ඇසීම පිණිස |
| **දිස්වා** | **(පූ.ක්‍රි)** | - | දැක |
| **කුහිං** | **(නි)** | - | කොහි |
| **තමත්ථං** | **(සං)** | - | ඒ කරුණ |
| **අහම්පි** | **(සං)** | - | මම ද |
| **චින්තෙත්වා** | **(පූ.ක්‍රි)** | - | සිතා |
| **කනිට්ඨං** | **(ත)** | - | බාලයා |
| **ආමන්තෙත්වා** | **(පූ.ක්‍රි)** | - | අමතා |
| **හොහි** | **(ක්‍රි)** | - | වන්න |
| **පරිසපරියන්තෙ** | **(ස)** | - | පිරිස කෙළවර |
| **අජ්ඣාසයවසෙන** | **(ස)** | - | අදහස්වලට අනුව |
| **ආනුපුබ්බීකථං** | **(ස)** | - | පිළිවෙළ කථාව |
| **අනෙකපරියායෙන** | **(ස)** | - | නොයෙක් ආකාරයෙන් |
| **කාමානං** | **(නා)** | - | කාමයන්ගේ |
| **ආදීනවං** | **(නා)** | - | ආදීනව |
| **ඔකාරං** | **(නි)** | - | ලාමක බව |
| **සංකිලෙසං** | **(ස)** | - | කෙලෙස් සහිත බව |
| **පහාය** | **(පූ.ක්‍රි)** | - | හැර |
| **ගන්තබ්බං** | **(කි)** | - | යා යුතු ය |
| **ඤාතයො** | **(නා)** | - | ඥාතීහු |

**අභ්‍යාස**

01. 'සබ්බං කිර පහාය ගන්තබ්බං' ජේදය සිංහලට නගන්න.

02. ජේදය ඇසුරෙන් පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තයො භාතරො කත්ථ වසිංසු?
ii. කෙ භණ්ඩානි ආහරන්ති?
iii. කො භණ්ඩානි වික්කිණාති?
iv. මහාකාලො ධම්මං සොතුං කත්ථ නිසීදි?
v. ධම්මං සොතුං ගච්ඡන්තා කස්මිං සමයෙ ගච්ඡන්ති?
vi. මහාකාලො කිං නිස්සාය පබ්බජිතුං චින්තෙසි?

03. ඡේදයේ එන වාක්‍ය රටාව අනුව පහත වාක්‍යය පාලියට නගන්න.

i. අපගේ පිරිවෙණෙහි ධම්මජෝති, සුමනජෝති, විමලජෝති යනුවෙන් යහළු සාමණේරවරු තිදෙනෙක් වෙති.
ii. ඔවුන් අතුරින් විමලජෝති සාමණේර තෙම උදෑසන පිණ්ඩපාතය පිණිස යයි.
iii. ධම්මජෝති, සුමනජෝති සාමණේරවරු දහවල් පිණ්ඩපාතයේ යති.
iv. සවස් කාලයේ තිදෙනා ම පිරිවෙණට ගොස් පාලි භාෂාව උගනිති.
v. ගුරුවරයා ඔවුන්ගේ අදහස්වලට ගැළපෙන ලෙස පාඩම උගන්වයි.

04. ඡේදය ඇසුරෙන් සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. පෙර සැවැත්නුවර වැසියෝ සවස් කාලයෙහි කුමක් කළාහු ද?
ii. අතීතයෙහි පැවති වෙළඳාම පිළිබඳ ඡේදයේ එන තොරතුරු මොනවා ද?
iii. පරලොව යන්නෝ ගෙන නොයන දේ මොනවා ද?
iv. අනුපිළිවෙළ කථාව යනු කුමක් ද?
v. සැදැහැ සිත් ඇතිවන හේතු දෙකක් ඡේදය ඇසුරෙන් පෙන්වා දෙන්න.

## සමාස

### හැඳින්වීම

'සමාස' යනු පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ ප්‍රවර්ගයකි. සමාසයෙන් සිදු වන්නේ පද සංක්ෂිප්ත කිරීම යි. **"සමාසො පද සංඛෙපො"** යන පාඨයෙන් ඒ බව තහවුරු වෙයි. සමාස නිසා භාෂාවේ සංක්ෂිප්ත බව, අර්ථ ගම්භීරත්වය, ඕජෝගුණය ඇති වේ. සමාසපද බහුලව යෙදීමෙන් භාෂා අලංකාරය, ශ්‍රැතිරම්‍යතාව හා අනුප්‍රාස රසය ද ඇති වේ. එනිසා ලේඛන කාර්යය සාර්ථකව පවත්වාගෙන යාමටත්, පාලි වාක්‍ය ප්‍රයෝගයන් නිවැරදිව තේරුම් ගැනීමටත්, සමාස ඉගෙන ගැනීම උපයුක්ත වේ.

**"නාමානං සමාසො යුත්තත්‍ථො - සමාසොති භින්නත්‍ථානං පදානමෙකත්‍ථතා"** යන බාලාවතාර සූත්‍ර වෘත්තියට අනුව, වෙන් වෙන් අර්ථ ඇති, අන්‍යොන්‍ය සම්බන්ධය සහිත පද කීපයක් තනිපදයක් වන සේ ගැළපීම සමාසය යි. සමාසපද සිද්ධියේ දී මුල් පදයන්හි විභක්තිය ලොප් වී ශබ්ද ප්‍රකෘතිය පමණක් ශේෂ වීම විශේෂ කරුණකි.

නිදා:- රඤ්ඤො පුරිසො = රාජපුරිසො
බ්‍රාහමණී දාරිකා = බ්‍රාහමණදාරිකා

පද සංක්ෂිප්ත වන ස්වරූපය හා සමාස අර්ථවත් වන ස්වරූපය සැලකිල්ලට ගෙන සමාස ප්‍රභේද 6ක් බාලාවතාරයේ දක්වේ.

| | | | |
|---|---|---|---|
| i. | කම්මධාරය සමාසය | ii. | දිගු සමාසය |
| iii. | තප්පුරිස සමාසය | iv. | බහුබ්බීහි සමාසය |
| v. | ද්වන්ද සමාසය | vi. | අව්‍යයීභාව සමාසය. |

**සමාසපද ලිංග ලබන අයුරු**

"කම්මධාරයො ද්වන්දො ච - තප්පුරිසො ච ලාභිනො,
තයො පරපදෙ ලිඞ්ගං - බහුබ්බීහි පදන්තරෙ"

ඒ අනුව

**i. කම්මධාරය සමාසය :- පරපදයේ ලිංගය ලබයි.**

මහන්තො පුරිසො - මහාපුරිසො (පුල්ලිංග)
මහතී සද්ධා - මහාසද්ධා (ස්ත්‍රීලිංග)
මහන්තං ඵලං - මහප්ඵලං (නපුංසකලිංග)

**ii. දිගු සමාසය**

**සමාහාරදිගු සමාසය :- නපුංසකලිංග ඒකවචන වේ.**
තයො දණ්ඩා - තිදණ්ඩං
චත්තාරි සච්චානි - චතුසච්චං

**අසමාහාරදිගු සමාසය :- පරපදයේ ලිංගය ලබයි.**
චතස්සො දිසා - චතුද්දිසා (පුල්ලිංග)
තයො භවා - තිභවා (ස්ත්‍රීලිංග)
පුත්තා සතං - පුත්තසතානි (නපුංසකලිංග)

**iii. තප්පුරිස සමාසය :- පරපදයේ ලිංග ලබයි.**

දෙවානං රාජා - දෙවරාජා (පුල්ලිංග)
ධඤ්ඤානං රාසි - ධඤ්ඤරාසි (ස්ත්‍රීලිංග)
ජිනස්ස වචනං - ජිනවචනං (නපුංසකලිංග)

**iv.** **ද්වන්ද්ව සමාසය**

**සමාහාර ද්වන්ද්වය :- නපුංසක ලිංග ඒකවචන වේ.**
මුඛං ච නාසිකා ච = මුඛනාසිකං
ආලො ච පාචනො ච = ආලපාචනං

**ඉතරීතරයෝග ද්වන්ද්ව සමාසය :- පරපදයේ ලිංග ලබයි.**
සීහා ච ව්‍යග්ඝා ච තරච්ඡා ච = සීහව්‍යග්ඝතරච්ඡා
රත්ති ච දිවා ච = රත්තින්දිවා
හිරඤ්ඤං ච සුවණ්ණං ච = හිරඤ්ඤසුවණ්ණානි

**v.** **බහුබ්බීහි සමාසය :- අන්‍ය පදයේ ලිංගය ගනියි.**

| | | |
|---|---|---|
| විජිතමාරා අනෙනාති | = විජිතමාරො (භගවා) | (පුල්ලිංග) |
| ආරූළ්හා වාණිජා යං | = ආරූළ්හවාණිජා (නාවා) | (ස්ත්‍රීලිංග) |
| බහවො මාතඞ්ගා අස්මිං | = බහුමාතඞ්ගං (වනං) | (නපුංසකලිංග) |

**vi.** **අව්‍යයීභාව සමාසය :- නපුංසකලිංග ඒකවචන වේ.**

භත්තස්ස පුරෙ = පුරෙභත්තං
බලස්ස යථා = යථාබලං

සමාසයන්ගේ ප්‍රභේද බාලාවතාර සූත්‍රානුසාරයෙන් පහත විස්තර කෙරේ.

**කම්මධාරය සමාසය**

තුල්‍යාධිකරණ වූ හෙවත් ලිංග, විභක්ති, වචන වශයෙන් සමාන වූ විශේෂණ - විශේෂ්‍ය පද දෙකක් පූර්ව පදයන්හි විභක්ති ලොප් කොට ගැළපීම කම්මධාරය සමාසය යි. "**ද්විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො**" යන සූත්‍රයෙන් එය විස්තර වේ. කම්මධාරය සමාසයේ පද යෝජනය අනුව එහි ප්‍රභේද 9 කි.

**i.** **විශේෂණ පූර්වපද කම්මධාරය සමාසය**
මහන්තො සො වීරො = මහාවීරො
නාගා සා මාණවිකා = නාගමානවිකා
මහන්තං තං බලං = මහාබලං (මහබ්බලං)

**ii.** **විශේෂණ උත්තරපද කම්මධාරය සමාසය**
සාරිපුත්තො සො ථෙරො = සාරිපුත්තත්ථෙරො
මහොසධො සො පණ්ඩිතො = මහොසධපණ්ඩිතො

iii. **විශේෂණෝභය (පද දෙක ම) පද කම්මධාරය සමාසය**

බ්‍යඤ්ජා සො බුජ්ජො = බ්‍යඤ්ජබුජ්ජො

ජිනතං තං හිනතං = ජිනතහිනතං

iv. **උපමානුත්තරපද කම්මධාරය සමාසය**

සීහො විය මුනි = මුනිසීහො

නාගො විය බුද්ධො = බුද්ධනාගො

v. **සම්භාවනා පූර්වපද කම්මධාරය සමාසය**

ධම්මො ඉති සඤ්ඤා = ධම්මසඤ්ඤා

අනිච්චං ඉති සඤ්ඤා = අනිච්චසඤ්ඤා

vi. **අවධාරණ පූර්වපද කම්මධාරය සමාසය**

ගුණො එව ධනං = ගුණධනං

පඤ්ඤා එව රතනං = පඤ්ඤාරතනං

vii. **න නිපාත පූර්වපද කම්මධාරය සමාසය**

න බ්‍රාහ්මණො = අබ්‍රාහ්මණො

න සුරො = අසුරො

viii. **කු නිපාත පූර්වපද කම්මධාරය සමාසය**

කුච්ඡිතො පුරිසො = කුපුරිසො / කාපුරිසො

කුච්ඡිතා දිට්ඨි = කුදිට්ඨි

ix. **පාදි පූර්වපද කම්මධාරය සමාසය**

පධානං වචනං = පාවචනං

සුන්දරො ගන්ධො = සුගන්ධො

## දිගු සමාසය

**"සඞ්ඛ්‍යා පුබ්බො දිගු"** යන බාලාවතාර සූත්‍රයට අනුව සංඛ්‍යාවාචී පදයක් විශේෂණයක් පූර්වපදය ලෙස සිට සිදුවන සමාසය දිගු සමාසය යි. සංඛ්‍යාවේ අර්ථයට ප්‍රමුඛත්වය හිමි වීම මෙහි ලක්ෂණය යි. සංක්ෂිප්ත වන ස්වරූපය අනුව මෙහි ප්‍රභේද 2 කි.

i. **සමාහාර දිගු සමාසය** :- සමාස පදය නිත්‍යයෙන් එකවචන හා නපුංසකලිංග වේ.

තයො ලොකා = තිලොකං

චත්තාරි සච්චානි = චතුසච්චං

චතස්සො දිසා = චතුද්දිසං

ii. **අසමාහාර දිගු සමාසයː-** පරපදයේ ලිංගය ලබයි.

| | |
|---|---|
| එකො පුගගලො | = එකපුගගලො |
| තයො භවා | = තිභවා |

## තප්පුරිස සමාසය

**"අමාදයො පරපදෙහි"** අං ආදි (දුතියා) විභක්ත්‍යන්ත නාම පදයක් පරපදයක් හා සමාස වීම මෙහි ලක්‍ෂණය යි. විභක්ත්‍යර්ථයට ප්‍රමුඛතාවක් හිමි වේ. එහි පදයෝජනය අනුව ප්‍රභේද 7 කි.

**දුතියා තප්පුරිස සමාසය**

| | |
|---|---|
| සරණං ගතො | = සරණගතො |
| දුක්ඛං පත්තො | = දුක්ඛප්පත්තො |

**තතියා තප්පුරිස සමාසය**

| | |
|---|---|
| සීලෙන සමපන්නො | = සීලසමපන්නො |
| සත්‍ථාරා වණ්ණිතො | = සත්‍ථුවණ්ණිතො |

**චතුත්‍ථී තප්පුරිස සමාසය**

| | |
|---|---|
| කඨිනස්ස දුස්සං | = කඨිනදුස්සං |
| ආගන්තුකානං භත්තං | = ආගන්තුකභත්තං |

**පඤ්චමී තප්පුරිස සමාසය**

| | |
|---|---|
| රාජතො භයං | = රාජභයං |
| පිණ්ඩපාතා පටික්කන්තො | = පිණ්ඩපාතපටික්කන්තො |

**ඡට්ඨී තප්පුරිස සමාසය**

| | |
|---|---|
| ජිනස්ස චරිතං | = ජිනචරිතං |
| රුක්ඛස්ස මූලං | = රුක්ඛමූලං |

**සත්තමී තප්පුරිස සමාසය**

| | |
|---|---|
| විකාලෙ භොජනං | = විකාලභොජනං |
| වනෙ වාසො | = වනවාසො |

**අලොප තප්පුරිස සමාසය** (විභක්ති ලොප් නොවී පද සිද්ධ වේ)

| | |
|---|---|
| අත්තනො පදං | = අත්තනොපදං |
| අන්තෙ වාසිකො | = අන්තෙවාසිකො |

## ද්වන්ද්ව සමාසය

"**නාමානං සමුච්චයො ද්වන්දො**" ඒකවිභක්තික නාම පදයන් සමූහයක් තනිපදයක් සේ ගළපන සමාසය යි. "**ච**" යන නිපාතයෙන් ගළපන පද සමූහයක් වීම නිපාතය ඉවත් කොට තනි පදයක් සේ ගැළපීම මෙහි ලක්‍ෂණය යි. සමාස පදයේ ස්වරූපය අනුව මෙහි ප්‍රභේද 2 කි.

1. **සමාහාර ද්වන්ද්ව සමාසය** :- සමාස පදය හැමවිට ම නපුංසකලිංග ඒකවචනයෙන් යෙදේ.

ඩංසා ච මකසා ච = ඩංසමකසං
යුගං ච නඞ්ගලං ච = යුගනඞ්ගලං
ජාතරූපං ච රජතං ච = ජාතරූපරජතං

2. **ඉතරීතරයෝග ද්වන්ද්ව සමාසය** :- මෙහි දී සමාසපදය අග ම පදයේ ලිංගය භජනය කරන අතර බහුවචනයෙන් යෙදේ.

සමණා ච බ්‍රාහමණා ච = සමණබ්‍රාහමණා
මාතා ච පිතා ච = මාතාපිතරෝ
පත්තො ච චීවරං ච = පත්තචීවරානි

## බහුබ්බීහි සමාසය

"**අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි**" සමාස වූ පදයන්ගේ අර්ථය හැර වෙනත් අර්ථයක් ප්‍රකාශ කරන සමාසය බහුබ්බීහි සමාසය යි. සමාස පදයේ ලක්‍ෂණ අනුව මෙහි ප්‍රභේද 2 කි.

1. **තද්ගුණ සංවිඤ්ඤාණ බහුබ්බීහි සමාසයඃ**- සමාස වන පදයන්හි අදහස සමාසාර්ථයෙහි එනම් අන්‍ය පදයෙහි දක්නට ලැබීම යි.

චත්තාරො පාදා යෙසං තෙ = චතුප්පදා
ලම්බකණ්ණා යස්ස සො = ලම්බකණ්ණො (ඛත්තියො)

2. **අතද්ගුණ සංවිඤ්ඤාණ බහුබ්බීහි සමාසයඃ**- සමාස වූ පදයන්හි ලක්‍ෂණ අන්‍ය පදයෙහි දක්නට නොමැති සමාසය යි.

ආරූළ්හා වාණිජා යං සා = ආරූළ්හවාණිජා (නාවා)
විජිතා මාරා යෙන සො = විජිතමාරො (භගවා)

සමාස පදයේ අර්ථය සැලකිල්ලට ගෙන මෙය දුතියාදි අර්ථවල යෙදෙන අයුරු පහත දැක්වේ.

**දුතියා විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය**

ආගතා සමණා යං සො = ආගතසමණො (විහාරො)
පටිපන්නා අද්ධිකා යං තං = පටිපන්නද්ධිකං (මග්ගං)

**තතියා විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය**

ජිතානි ඉන්ද්‍රියානි යෙන සො = ජිතින්ද්‍රියො (භගවා)
දිට්ඨො ධම්මො යෙන සො = දිට්ඨධම්මො (අරියසාවකො)

**චතුත්ථී විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය**

උපහටො බලි යස්ස සො = උපහටබලි (යක්ඛො)
දින්නො සුඛකො යස්ස සො = දින්නසුඛකො (රාජා)

**පංචමී විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය**

අපෙතං විඤ්ඤාණං යස්මා සො = අපෙතවිඤ්ඤාණො (මතකායො)
නිග්ගතො අයො යස්මා සො = නිරයො

**ඡට්ඨී විභක්ත්‍යර්ථ බහුබ්බීහි**

ඛීණා ආසවා යස්ස සො = ඛීණාසවො (අරහා)
දසබලානි යස්ස සො = දසබලො (භගවා)

**සත්තමී විභක්ත්‍යර්ථ බහුබ්බීහි**

බහවො තාපසා යස්මිං සො = බහුතාපසො (අස්සමො)
ආකිණ්ණා මනුස්සා යස්මිං තං = ආකිණ්ණමනුස්සං (නගරං)

බහුබ්බීහි සමාසය ප්‍රභේදගත වන්නේත් අර්ථවත් වන්නේත් ප්‍රකාශ වන අන්‍යාර්ථය සැලකිල්ලට ගෙන බව ප්‍රකට වේ.

**අව්‍යයීභාව සමාසය**

**"උපසග්ගනිපාතපුබ්බකො අබ්‍යයීභාවො"** උපසර්ගයක් හෝ නිපාතයක් පෙර පදය ලෙස යෙදී සිදු වන සමාසය අව්‍යයීභාව සමාසය යි. මෙමගින් නිර්මාණය වන සමාස පද නිපාත පදයක් ලෙස යෙදීම සාමාන්‍ය ලක්ෂණය යි. අකාරාන්ත අව්‍යයීභාව සමාස පද නපුංසකලිංග ඒකවචනයේ වරනැගේ. අකාරාන්ත නොවන පද නිපාත ස්වරූපයෙන් ම සිටී.

නගරස්ස සමීපං = උපනගරං
රථස්ස පච්ඡා = අනුරථං
වාතස්ස අනු = අනුවාතං
අද්ධමාසං අනු = අන්වද්ධමාසං
ජීවස්ස යාව = යාවජීවං

අකාරාන්ත නොවන පද (අනකාරාන්ත පද)

ඉත්ථීසු අධිකිච්ච = අධිත්ථි
සත්ති යථා = යථාසත්ති
කුමාරියා අධිකිච්ච = අධිකුමාරි

**මිශ්‍ර සමාස පද**

මිශ්‍ර සමාස යනු එක් සමාස පදයක තවත් සමාස පදයක් ඇතුළත් ඒවා ය. මේවා ගර්භ සමාස ලෙස ද හැඳින්වේ. 'රාහුලමාතාදෙවී' යනු නිදසුනකි.

රාහුලස්ස මාතා = රාහුලමාතා තප්පුරිස සමාසයකි
රාහුලමාතා සා දෙවී = රාහුලමාතාදෙවී කම්මධාරය සමාසයකි.

මේ සමාස පදය හැඳින්විය යුත්තේ **තප්පුරිස සමාස ගැබ් වූ කම්මධාරය සමාස** යන නමිනි.

පහත දැක්වෙන්නේ එවැනි සමාස පද කීපයකි.

| සමාස පදය | විග්‍රහ වාක්‍ය | සමාස පදය හා නාමය |
|---|---|---|
| සද්ධම්මදෙසනං | ධම්මස්ස දෙසනා | ධම්මදෙසනා - තප්පුරිස සමාස |
| | සතං ධම්මදෙසනා | සද්ධම්මදෙසනා - තප්පුරිස සමාස |
| එකගන්ධකුටියං | ගන්ධා සා කුටි | ගන්ධකුටි - කම්මධාරය සමාස |
| | එකා සා ගන්ධකුටි | එකගන්ධකුටි - දිගුසමාස |
| ජේතවනමග්ගං | ජේතස්ස වනං | ජේතවනං - තප්පුරිස සමාස |
| | ජේතවනස්ස මග්ගං | ජේතවනමග්ගං - තප්පුරිසසමාස |
| සත්තමනුස්සකොටියො | මනුස්සානං කොටි | මනුස්සකොටි - තප්පුරිස සමාස |
| | සත්තන්නං මනුස්සකොටි | සත්තමනුස්සකොටි - දිගුසමාස |

මෙසේ විවිධ සමාස අන්තර්ගත වී සෑදෙන සමාස ගර්භ සමාස හෙවත් මිශ්‍ර සමාස ලෙස හැඳින්වේ.

**අභ්‍යාස**

01. වරහන් තුළ ඇති සමාසපද යොදමින් පහත සඳහන් වාක්‍යය පාලියට නඟන්න.

(ගෙහද්වාරානි / අප්පමත්තො / දක්ඛිණදෙසං / රථසතෙහි / නගරවාසී / පුරෙභත්තං / සායණ්හසමයෙ / උපොසථදිවසෙ / මාලාපදීපානි / මහාවීථියා)

i. රථය කොළඹත් කැලණියත් අතර මහපාරේ නතර විය.
ii. මව ගෙවල් දොරවල් ගැන සැලකිලිමත් වන්න යයි දියණියට කියා බණ අසන්නට ගියා ය.
iii. මන්ත්‍රීතුමා වාහන සියයකින් දකුණු ප්‍රදේශයට ගියේ ය.
iv. නගරවාසීන් අතුරෙන් ඇතැමෙක් උදෑසන දන් දී සවස්කාලයේ බණ අසති.
v. අපි පසළොස්වක පොහොය දා මල්පහන් පිදීමට පන්සලට යමු.

02. පහත සඳහන් අසමස්ත පද සමාස කර ලියන්න.

i. ජෙට්ඨො ච කනිට්ඨො ච
ii. රඤ්ඤො ධීතා
iii. රාහුලො කුමාරො
iv. මාතා ච පිතා ච
v. තිස්සො විජ්ජා
vi. සතං යොජනානි
vii. චන්දො ච සුරියො ච
viii. විධුරො පණ්ඩිතො
ix. වාතස්ස පටි
x. කම්මං යථා
xi. අස්සානං වාණිජා
xii. ධම්මස්ස දෙසනා

03. වරහන් තුළින් සුදුසු වචන යොදා වාක්‍යය සම්පූර්ණ කර, සිංහලට නඟන්න.

(නදීසතෙහි/ සත්තාහං/ මහාවනෙ/ නරාදිච්චං/ භික්ඛුනීනිලයා/ දෙවනාගාසුරා)

i. නරසාරථී වෙසාලියං ........... කූටාගාරසාලායං වසති.
ii. සා ගොතමී සබ්බාහි භික්ඛුනීහි ........... ජෙතවනං අගමාසි.
iii. පඤ්චගඞ්ගායො ........... භූමිං අලඞ්කරොන්තී සාගරං යන්ති.
iv. අහං ආදිච්චකුලකෙතුකං ........... සිරසා පණමාමි.
v. තෙ සසඞ්ඝස්ස නරනායකස්ස ........... මහාදානං අදංසු.
vi. ........... පුප්ඵවුට්ඨී ගගනා අභිවස්සාපෙසුං.

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

| සමාස පදය | සමාස නාමය | අසමස්ත පදය |
|---|---|---|
| නිදඃ- චූළකාලො | කම්මධාරය සමාසය | චූළො කාලො |
| පුරාණදුතියිකා | | |
| රුක්ඛමූලෙ | | |
| බුද්ධපුත්තා | | |
| දහරමාණවිකා | | |
| බ්‍රහ්මචරියං | | |
| මෙරුරාජා | | |
| සත්ථුසාසනං | | |
| බුද්ධමාතා | | |
| යථාබලං | | |
| යථාසත්ති | | |
| දෙවමනුජා | | |
| මෙඝදුන්දුභි | | |
| මහාමුනි | | |
| ආයතපණ්හි | | |
| නරුත්තමො | | |

05. පහත දැක්වෙන ගර්භ සමාසයන්හි ඇති සමාස වර්ග වෙන් කර දක්වන්න.

i. සත්ථුසාසනකාරිකා
ii. බුද්ධසාසනවච්ඡලා
iii. ලොකගගනායකො
iv. ඔක්කාකකුලසම්භවො
v. චතුසාගරතොයානි